## පුනරීක්ෂණ අභ්‍යාස

1. යාන්ත්‍රිකව හා රසායනිකව ආහාර ජීර්ණ ක්‍රියාවලිය සිදුවන ජීර්ණ පද්ධතියේ ප්‍රධාන කොටස් නම් කරන්න.
2. ඛේට ග්‍රන්ථි නම් කරන්න.
3. ඛේටයේ අඩංගු එන්සයිමය නම් කරන්න.
4. මුඛය තුළට ගොස් ආහාර පහසුවෙන් ගිලීමට හැකි වන්නේ ඛේටයේ අඩංගු කුමන ස්නේහක ද්‍රව්‍ය නිසාද?
5. ක්‍රමාකුංචන ක්‍රියාවලිය හඳුන්වන්න.
6. ආමාශයික යුෂයෙහි අඩංගු එන්සයිම 02 නම් කරන්න.
7. ආමලසය ලෙස හඳුන්වන්නේ කුමක්ද?
8. ආමාශයක කොටස් රූප සටහනකින් නම් කරන්න.
9. අග්න්‍යාශයෙන් ශ්‍රාවය වන එන්සයිම නම් කරන්න.
10. පිත්තාශයෙන් කෙරෙන කාර්යය නම් කරන්න.
11. යුෂය දහරාකාර ස්වරූපයකින් සමන්විත නාලය නම් කරන්න.
12. අංගුලිකාවලින් කෙරෙන කාර්යය ලියන්න.
13. අංගුලිකා පිහිටා ඇත්තේ කොහේද?
14. මහා අන්ත්‍රයෙන් සිදුවන කාර්යයන් 03ක් ලියන්න.
15. ආහාර ජීර්ණය කෙරෙහි බලපාන සාධක 03ක් ලියන්න.
16. මේද තෛලෝද්කරණය හඳුන්වන්න.
17. ප්‍රෝටීන් ජීර්ණය ආරම්භ වන්නේ කුමන ඉන්ද්‍රියන් තුළදීද?
18. ආහාර ජීර්ණයේ අවසන් ඵල වන මොනසැකරයිඩ වර්ග හා ඇමයිනෝ අම්ලත් මේද අම්ල හා ග්ලිසරෝල් අවශෝෂණය වනනේ කුමන නාල වලටද?
19. මූලස්ථ පරිවෘත්තීය වේගය යනුවෙන් කුමක් අදහස් වේද?
20. ගර්භණී අවධියේදී අයඩින් අඩු වීම නිසා ඇතිවන අයහපත් තත්ත්වයන් 04ක් ලියන්න.
21. ක්ෂීරණ අවධියේදී මවක් දිනකට නිපදවන මව්කිරි ප්‍රමාණය කොපමණද?
22. මවගේ මල බද්ධය වළක්වා ගැනීමට ආහාරයට එක් කළ යුතු ආහාර වර්ග නම් කරන්න.
23. නිර්දේශිත පෝෂණ අවශ්‍යතා සටහනට අනුව සාමාන්‍ය කාන්තාවකට වඩා ක්ෂීරණ මවකට වැඩි කළ යුතු කිලෝ කැලරි ප්‍රමාණය දක්වන්න.
24. මහලු වියට ආහාර වේල් සැලසුම් කිරීමේදී වැඩි අවධානයක් යොමු කළ යුතු කරුණු 03ක් ලියන්න.
25. මහලු අවධියේ පසුවන අයෙකු සඳහා රාත්‍රී ආහාර වේලකට සුදුසු බොජුන්පතක් සැලසුම් කරන්න.